# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 20 දරන
# ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 ජූලි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල: ශත 30 යි. තැපැල් ගාස්තුව: ශත 75 යි.

**1988 අංක 20 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 34/85

**1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1988 අංක 20 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — *ලුහුඬු නාමය.*

**2.** මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 73 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 73අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:— — *ප්‍රධාන ප්‍රඥප්තියේ 73අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

*" ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ සියලු වත්කම් ආදිය අධිකාරියට පැවරීම.*

73අ. අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක නිශ්චිතව සඳහන්—

(අ) නියමිත දිනයට පෙර වූ දිනයේදී ජාතික නිවාස දෙපාර්තමේන්තුව සතු වී තිබූ (නිශ්චල දේපළ ද ඇතුළුව) සියලු වත්කම්; සහ

(ආ) ජාතික නිවාස දෙපාර්තමේන්තුව විසින් හෝ එය සමඟ ඇති කරගනු ලැබ නියමිත දිනයට ඉහතින් වූ දිනයේ දී පවත්නා සියලු ගිවිසුම් හා එකඟවීම්

නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අධිකාරිය වෙත පවරා සතු කරනු ලැබිය යුතු ය.".

**3.** මේ පනතේ 2 වන වගන්තිය මගින් ඇතුළත් කරනු ලැබූ පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 73 අ වගන්තිය යටතේ කරනු ලැබූ සෑම නියමයක් ම, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දිනයේ සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ නියමයේ නිශ්චිතව සඳහන් සියලු වත්කම්, ගිවිසුම් හා එකඟවීම්, ඒ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ප්‍රධාන ප්‍රඥප්තිය මගින් පිහිටුවනු ලැබූ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පැවරීමේ හා අධිකාරිය සතු කිරීමේ බල පෑම, එහි තිබිය යුතු ය." — *73 අ වගන්තිය යටතේ කරන ලැබූ නියමයක් අතීතයට බලපෑම.*

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.